www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නිව්ස්වීක් සඟරාවේ ජාත්‍යන්තර කර්තෘගේ "ධනේශ්වර ප්‍රකාශනය"
# යලි සහතිකවීමේ මංමුලාසහගත උත්සාහයක්

**Newsweek International editor's "Capitalist Manifesto"**
**A desperate attempt at reassurance**

නික් බීම්ස් විසිනි
2009 ජූලි 04

**ජා**ත්‍යන්තර නිව්ස්වීක් සඟරාවේ කර්තෘ ෆරීඩ් සකාරියා, ''ධනේශ්වර ප්‍රකාශනය- කැදරකම හොඳය, (එක්තරා තැනක් දක්වා)'' යන සිරස්තලය සහිතව ලිපියක් සම්පාදනය කර ඇති අතර, එහි අරමුන වන්නේ, ගෝලීය මූල්‍ය අර්බුදය විසින් කුලුගන්වන ලද භීතිකාවට පවන් සැලීමත්, දැන් අර්බුදය තුරල් වෙමින් යන බව හා, එහි සියලු දොස් තිබිය දී ම ධනවාදය, තවමත් ''අප සොයාගෙන තිබෙන ඉතාමත් පලදායී ආර්ථික යාන්ත්‍රනය'' බවත් සහතික කිරීමයි.

මෙම ප්‍රකාශයේ ගැටලුව නම්, අර්බුදය අවසන්වීම කෙසේ වෙතත් එය දිග හැරීමට පටන් ගත්තා පමනක් වීම ය.

සකාරියා පටන් ගන්නේ, පසුගිය 20 වසරේ සියලු මූල්‍ය අර්බුද, තව තවත් ආර්ථික වර්ධනයට හේතුකාරක වෙමින් විසඳගෙන තිබීමේ කාරනයට වාරු වෙමින් ය. 1987 කොටස් වෙලඳපොලෙහි බිඳ වැටීම, මහා අවපාතය දක්වා පල්ලම් බැසීමක්ය යන අනාවැකිය නිෂ්ප්‍රභා කරමින්, ''වඩාත් විශාල, දිගු උත්පාතයක ගමන් මගෙහි මං සලකුනක් බවට පත්විය.'' 1997 ආසියානු මූල්‍ය අර්බුදය ගෝලීය පසුබෑමකට තුඩු දුන්නේ නැත. ඒ වෙනුවට සිදුවූයේ ආසියානු ආර්ථිකයන් ''දෙවසරක් තුල යථා තත්වයට පත්වීමයි.'' ''50 වසරක් තුල ඇතිවූ නරකම මූල්‍ය අර්බුදය'' ලෙස එවකට එක්සත් ජනපද භාන්ඩාගාර ලේකම් රොබට් රූබින් විස්තර කල, 1998 වසරේ දිගු කාලීන ප්‍රාග්ධන කලමනාකරනයේ බිඳ වැටීමෙහි ප්‍රතිපලය වූයේ ආරක්ෂිත අරමුදල් ක්‍රමයේ අවසානය නොවේ. එතැන් සිට ඒවායේ ''දැවැන්ත පරිමාන'' ප්‍රසාරනයක් පවා සිදු විය.

මේ කියන පූර්ව අර්බුද ජය ගත්තේ කෙසේ ද? සකාරියාට අනුව නම්, එක්සත් ජනපද ෆෙඩරල් රිසර්ව් (මහ බැංකු) සභාපති ඇලන් ග්‍රීන්ස්පෑන්, වත්කම් බුබුලු ගනනාවක් නිර්මානය කිරීමට තුඩු දුන්නාවූ පහසු මුදල් සම්පාදනය හා පොලී අනුපාතිකයන් කපා හැරීමේ එම විසඳුම ම හැම විටම ඉදිරිපත් කිරීම ඊට හේතු විය.

2007 වසරේ අවමුඛ උකස් අර්බුදය වැඩී යන විට ෆෙඩරල් බැංකු සභාපති බෙන් බර්නන්කේ ද එම පිලිවෙතම අනුගමනය කලේය. කෙසේ වෙතත් එම අවස්ථාවේදී පොලී අනුපාතික පහත දැමීම අර්බුදය දුරු කිරීමට සමත් වූයේ නොවේ. බැංකුව 2007 අගෝස්තුවේ ද්‍රවශීලතාවය එන්නත් කිරීමට පටන් ගත් නමුදු, සිදුවූයේ තත්වය තවත් නරක අතට හැරීම පමනකි. 2008 මාර්තුවේදී බෙයාර් ස්ටියර්න්ස් ආයෝජන බැංකුව කඩා වැටුනු අතර සැප්තැම්බරයේදී ලේමන් බ්‍රදර්ස් බිඳ වැටුනි. 2008 අවසන් වන විට දැවැන්ත ද්‍රවශීලතා එන්නතින් පසුවත් වෝල් වීදියේ ආයෝජන බැංකු පහම එක්කෝ බිඳ වැටීමට හෝ ප්‍රතිව්‍යුහගත කිරීමට මුහුනපා සිටි අතර, ගෝලීය මූල්‍ය පද්ධතිය දියවීයාමේ අද්දර රැඳී සිටියේය.

මෙයම පමනක් වුවත් පෙන්නුම් කරන්නේ, සකාරියා විසින් පින්තාරු කල ශුභවාදී වාතාවරනය කෙසේ වෙතත් (එනම් මෙම අර්බුදය ද 1987 පටන් පැන නැගි අනෙක්වා සේ ම වනු ඇතැයි යන්න) 2007 වසරේ ඇරඹි බිඳ වැටීම වනාහි ඇදී යන ක්‍රියාවලියක ගුනාත්මක හැරීමක් සලකුනු කරන බවයි.

සකාරියාට ම පිලිගැනීමට බලකෙරී ඇත්තේ, ගෝලීය මූල්‍ය පද්ධතිය ''පසුගිය 30 වසරක ඉතිහාසයේ වෙනත් සැසඳිය හැකි කිසිදු අවධියකදීට වඩා නිරන්තරව කඩා වැටෙමින්'' තිබෙන බවයි. එහෙත් ඔහු අවධාරනය කරන්නේ ගැටලුව ලාභ පද්ධතිය තුලටම සම්බන්ධ නොවන බවයි. ''අප අත්විඳිමින් සිටින්නේ ධනවාදයේ අර්බුදයක් නොවේ. එය වනාහි මූල්‍ය ක්‍රමයේ, ප්‍රජාතන්ත්‍රවාදයේ, ගෝලීයකරනයේ හා අවසාන වශයෙන් ආචාර ධර්ම පිලිබඳ අර්බුදයකි.''

පලමු කොටම, ධනේශ්වර නිෂ්පාදන විධිය, පවත්නා ආචාර ධර්ම ද ඇතුලත් සමාජ-දේශපාලන වාතාවරනය හැඩ නොගස්වන අතරතුරදී පවා, කෙසේ හෝ එය රැඳී සිටින්නාවූ ඓතිහාසික තත්ත්වයෙන් ගොඩ ඒමට සමත්වනු ඇතැයි යන ප්‍රකාශ ද, මෙම සෑම සංසිද්ධියකින්ම ධනවාදය වෙන්කරලීම ද වනාහි, අභූතයකි.

අර්බුදය පිලිබඳ සකාරියාගේ පැහැදිලි කිරීම් එකින් එකට අනු පිලිවෙලින් අපි විමසා බලමු. අනෙක් බොහෝ දේ සමඟ ඔහු, වැරැද්ද පැටවෙන්නේ මූල්‍ය පද්ධතියේ ක්‍රියාකාරීත්වය මත යයි අවධාරනය කරයි.

''මූල්‍යය වැඩ වරද්දාගෙන ඇත. නොඑසේව වඩාත් නිවැරදිව කිවහොත් මූල්‍ය කලමනාකරුවන් එසේ කර ඇත. මූල්‍ය අර්බුදය ආරම්භවූ 2007 ජූනි වන විට, කොකා-කෝලා, පෙප්සි කෝ, අයිබීඑම්, නයිකි, වැල්-මාර්ට් හා මයික්‍රොසොෆ්ට් සිය සමාගම් සවිමත් ශේෂපත්‍ර හා නැනවත් ව්‍යාපාරික ආකෘතීන් සහිතව පවත්වාගෙන ගියේය. ප්‍රධාන ඇමරිකානු සමාගම් බෙහෙවින් ලාභදායී විය. ඒවා පසුබෑමක් සමහන් කිරීමට මුදල් සංචිත පවත්වාගත් අතර විචක්ෂන ලෙස වියපැහැදම් කලෝය.''

මූල්‍ය (නරක පැත්ත) අවශේෂ ධනේශ්වර ආර්ථිකයෙන් (හොඳ පැත්ත) වෙන් කිරීමෙහි ලා දිගු ඉතිහාසයක් පවතියි. වසර 150 කට පෙර ප්‍රන්ස සුලු ධනපති අරාජකවාදී ප්‍රෘදොන් පිලිබඳව මාක්ස් කල සිය විස්තීර්න විවේචනයේදී, එය ග්‍රහනය කර ගෙන තිබුනි. එවක දී මාක්ස් පැහැදිලි කල පරිදි, නිරතුරුව සිදු නොවනවාට වඩා, විශේෂයෙන් ''නරක'' පැත්ත ඓතිහාසික සංවර්ධනයේ ගාමක බලවේගය බවට පත්වන තතු යටතේ ''හොඳ'' පැත්තෙන් ''නරක'' පැත්ත වෙන් කල නොහැකි ය. වත්මන් තත්ත්වයේදී ද ප්‍රශ්නය එයයි. ඇමරිකානු ධනවාදය හා ගෝලීය ආර්ථිකයම ද පදනම්ව තිබුනේ, 1980 ගනන්වල දී ආරම්භ වූ මූල්‍යකරනයේ ක්‍රියාවලීන් සමඟ බැඳුනු ඉමහත් වෙනස්කම් මත ය.

සංඛ්‍යා ලේඛන කිහිපයකින් සිදුව ඇත්තේ කුමක්ද යන්න පැහැදිලි කෙරෙයි. 1980 දී සියලු ව්‍යාපාරික ලාභ වලින් සියයට 5 ක් හිමිකරගත් මූල්‍ය සමාගම්, 2006 වන විට හිමිකර ගත් ප්‍රතිශතය සියයට 40 දක්වා ඉහල නංවාගෙන තිබේ. ගෝලීය පරිමාවකින් ගත් කල 1980 මූල්‍ය වත්කම්වල වටිනාකම දල වශයෙන් ලෝක දල දේශීය නිෂ්පාදිතයට (දදේනි) සමාන විය. 25 වසරකට පසුව ඒවායේ පංගුව ගෝලීය දදේනි සියයට 350 ක් බවට පත් විය. මෙම පරිවර්තනයේ හදවතෙහි ම තිබුනේ එක්සත් ජනපද ආර්ථිකය තුල සමුච්චිතවූ මූල්‍ය අංශයේ නය කන්දරාවයි. එය 1997 දී දදේනි න් සියයට 63.8 ක සිට 2007 දී දදේනි න් සියයට 113 ක් තෙක් ඉහල ගියේය. මෙය, බැංකු හා මූල්‍යායතන සිය නය පදනම් කර ගත් මූල්‍ය මෙහෙයුම් සඳහා අරමුදල් සපයාගනු වස් නය තුලට ගැඹුරින්ම කඩාවැදීමෙහි ප්‍රතිපලයක් විය.

මූල්‍යකරනය නැගගෙන නැගගෙන යාම වූ කලී හුදෙක් ප්‍රතිපත්ති අභිමතයක් නොවූ අතර, 1960 ගනන් අවසන් භාගයේ හා 70 ගනන්වල ගොඩනැගී ආ ධනේශ්වර සමුච්ඡයකරන ක්‍රියාවලියේ අර්බුදය කෙරෙහි පලවූ ප්‍රතිචාරයකි. ලාභානුපාතිකයේ පහත වැටීමකට මුහුනපා සිටි ඇමරිකානු ධනවාදය, 1970 ගනන් වල අවසානයෙන් ඔබ්බට ප්‍රධාන ප්‍රතිව්‍යුහකරන වැඩ පිලිවෙලක් සඳහා යොමු විය. මෙයට, නිෂ්පාදන කර්මාන්තයේ විශාල පදාස විනාශ කිරීම ද කම්කරු පන්තියේ සමාජ තත්ත්වයන්ට අතොරක් නැතිව පහරදීම ද ශ්‍රමයේ ලාභ මූලාශ්‍රයන්හි වාසිය ඩැහැගැනීම පිනිස සමහර අංශ විදෙස්ගත කිරීම හා පිටතට හැරවීමේ (අවුට්සෝසිං) ක්‍රියාවලියක් වර්ධනය කිරීම ද ලාභයේ මූලාශ්‍රය ලෙස සතුරු අත්පත්කර ගැනීම් හා ඒකාබද්ධයන් වැනි මූල්‍ය උප්පරවැට්ටි ද අන්තර්ගත විය.

## සමුච්ඡකරනයේ නව විධිය

1980 ගනන්වල ඇමරිකානු ආර්ථිකයේ පරිවර්තනය තුල සමුච්ඡකරනයේ නව විධියක් නැගී එනු දැකගත හැකි විය. එහිදී ලාභය උපුටා ගත්තේ දැනටමත් නිර්මිතව තිබූ ධනය, මූල්‍ය ක්‍රමෝපායන් තුලින් සූරාකෑම තුලිනි. ඓතිහාසිකව ගත් කල, එක්සත් ජනපද ආර්ථිකයේ ධනය සමුච්ඡය කරගෙන තිබුනේ ආයෝජන, වෙලඳම හා නිෂ්පාදනය තුලිනි. දැන් ධන සමුච්ඡයේ ගාමක බලවේගය බවට පත්වන්නේ වත්කම් මිල ඉහල නැගීමයි. මෙය එක්සත් ජනපද ආර්ථිකයේ හැඩය ද, මූල්‍යයට සම්පව බැඳී නොමැති අංශ පවා ඇතුලත් කරගත් ප්‍රාග්ධනයේ සියලු අංශ මඟින් ලාභ සමුච්ඡය කිරීම ද, තීරනය කර තිබේ.

1950 හා 60 ගනන් තරම් ඈතදී පවා එකලස් කිරීමේ පේලි නිෂ්පාදනය මත පදනම්වූ කාර්මික නිෂ්පාදන ආයතන ඇමරිකානු ආර්ථිකයේ විශාලතම උපාංගය නොවී ය. එහෙත් ලාභදායිකත්වයේ ඉමහත් වර්ධනයක හැකියාව ජනනය කල මෙම ක්‍රමවේදයන්, ප්‍රාග්ධනයේ සියලු අංශවලට ප්‍රසාරනය වීමේ අවස්ථාව නිර්මානය කලේය. මෙය වනාහි සමාජ විද්‍යාඥයන් විසින් නම් කරන ලද ''ෆෝඩ්වාදී යාන්ත්‍රනය'' විසින් අධිකාරය දරන ලද සමාජයකි. හිටපු ජෙනරල් මෝටර්ස් ප්‍රධාන විධායක චාල්ස් විල්සන් ප්‍රකට ලෙස සඳහන් කල පරිදි ''රටට හොඳ දේ කුමක් ද එය ජීඑම් සඳහා ද හොඳ වන අතර එය අනෙක් පැත්තට ද එසේමය.''

පසුගිය 25 වසරේ ඇමරිකානු ආර්ථිකය තුල, කලකදී එකලස් කිරීමේ පේලි නිෂ්පාදනය ඉටුකර තිබෙන මූලික භූමිකාව, මූල්‍ය ප්‍රාග්ධනය විසින් හිමිකරගෙන තිබේ.

පුද්ගලික ධනේශ්වර ආයතනයක් කෙතරම් හොඳින් හෝ සාර්ථක ලෙස පවත්වාගෙන යන්නේ ද යන කාරනය තිබිය දී ම, ලාභ සමුච්ඡය වනාහි සමාජ ක්‍රියාවලියකි. සෑම ආයතනයක්ම සිය ප්‍රසාරනය පදනම්

කර ගන්නේ, සමස්තයක් ලෙස ආර්ථිකයේ ම වර්ධනය මතය. එක්සත් ජනපදයේදී ගාමක බලය වී ඇත්තේ මූල්‍ය ප්‍රාග්ධනයයි.

''හොඳ'' පැත්තෙන් ''නරක'' වෙන්කිරීමට දරන ඕනෑම උත්සාහයක් ලුහුඬු සමාලෝචනයක දී පවා බිඳ වැටෙයි. ඇමරිකානු ප්‍රාග්ධනයේ ''හොඳ'' පැත්ත පෙන්නුම් කිරීමේ කොටසක් ලෙස සකාරියා, විවිධ සමාගම් වෙත ඇඟිල්ල දිගු කරයි. ඉන් එකක් මයික්‍රොසොෆ්ට් ය. එහෙත් මයික්‍රොසොෆ්ට් හි ලාභයේ එක් ප්‍රධාන මූලාශ්‍රයක් වන්නේ, මූල්‍ය අංශය විසින් බල ගන්වා තිබෙන පරිගනක හා මෘදුකාංග වැඩසටහන් අලෙවි කිරීමයි. නයිකි හා වැල්-මාර්ට් ගෙන බලන්න. ඔවුන් ලාභ උපයා ඇත්තේ, භූගෝලීය නිෂ්පාදනයේ කොන්දේසි යටතේ චීනය හා අනෙකුත් රටවල ලාභ ශ්‍රමය සූරාකෑම මඟින් ය. එහෙත් සංකීර්න මූල්‍ය සම්බන්ධතාවන් ගෙන් සමන්විත මෙම ක්‍රියාන්විතයන්, මූල්‍ය ප්‍රභවයන්ගේ වර්ධනයකින් තොරව සිදු නොවිය හැකිව තිබුනි. ඒ සමග ම නයිකි හා වැල්-මාර්ට් සමාගම් වලට එක්සත් ජනපද පාරිභෝගික නය ඉහල යාමකින් තොරව ලාභදායී ලෙස නොපැවතිය හැකිය. එය සිදු වූයේ, පසුගිය සියවස් කාලක් තිස්සේ මූර්ත ආදායම එකතැන පල්වූ හෝ පිරිහී ගිය තතු හමුවේ, වැඩි හරියක් නිවාස මූල්‍ය කටයුතු තුලින් සිදුවූ ඇමරිකානු පරිභෝජන වියදම් තිරසාර කිරීම තුලිනි.

ගෝලීය මූල්‍ය අර්බුදයේ නොමඳ වැදගත්කම වනාහි, පසුගිය විසිපස් වසර පුරාවට පැවතීගෙන ආ සමුච්ඡයකරන විධියේ බිඳ වැටීම එමඟින් සලකුනු කිරීමයි.

මූල්‍ය වත්කම් සිය වටිනාකම ව්‍යුත්පන්න කර ගන්නේ, අවසන් විග්‍රහයේ දී මූර්ත ධන නිෂ්පාදනය මත සිය හිමිකම් ඉදිරිපත් කිරීමෙනි. විශේෂිතවූ සමාගමක් විසින් උත්පාදනය කරන ආදායම් ප්‍රවාහයේ කොටසක් සඳහා හිමිකම් පෑම, ව්‍යාපාර වස්තු කොටස වශයෙන් හැඳින්වේ. එහෙත් මෙම කොටස මිලට ගැනීම හෝ විකිනීම ද කල හැකිය. යටකී වත්කමෙහි අතිරික්ත වටිනාකමක් ද සහිතව වෙලඳපොලේ එහි වටිනාකම ඉහලයාමක් ද සිදුවිය හැකිය.

ගෝලීය නිෂ්පාදනයට සමානුපාතිකව පසුගිය දශක දෙක හමාරක කාලය තුල මූල්‍ය වත්කම් සිව් ගුනයක් තරම් ප්‍රමානයකින් ප්‍රසාරනය වී තිබීමේ කාරනයේ අර්ථය වන්නේ, මූර්ත ධනය මත ඒවා ඉදිරිපත් කරන සියලු හිමිකම් සපුරාලිය නොහැකි බවයි. මෙම විසංවාදය ප්‍රකාශිත වූයේ, අවශ්‍යයෙන්ම කිසිදු වටිනාකමක් නොමැති ඊනියා ''විස කැවුනු වත්කම්'' බැංකු හා මූල්‍ය සමාගම්වල පොත්පත් මත ගොඩ ගැසීම තුල ය.

වෙනත් වචන වලින් කිව හොත් මෙම අර්බුදය, නොඑසේ නම් නිරෝගිමත් පද්ධතියක ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා සැලකිය යුතු තරම් අරමුදල් හිඟ වීමෙන් හටගත් ද්‍රවශීලතාවයේ අර්බුදයක් නොව, බංකොලොත් භාවයේ අර්බුදයකි. මූල්‍ය වත්කම්වල අගය හා ගෝලීය දදේනි අතර 1980 දි පැවති සාම්‍යය යලි පිහිටුවීමෙහි අර්ථය, ගෝලීය දදේනි මෙන් දෙගුනයකට සමානවන මූල්‍ය වත්කම්වල වටිනාකම් අතුගා දැමීම ය. මෙම කාරනය මඟින් එහි පරිමානය ඇඟවුම් කරයි.

මෙම සංඛ්‍යාවන්, ලෝකය වටාම ආන්ඩු විසින් දියත් කල ඇපදීමේ හා උත්තේජක වැඩ පිලිවෙලේ අර්ථය පැහැදිලි කරයි. ඒවා කම්කරු පන්තියේ රැකියා හා ජීවන තත්ත්වයන් පවත්වා ගැනීම සමග ගැවිලාවත් නැත. ඒ වෙනුවට ඒවා ඉලක්ක කර ඇත්තේ මූල්‍ය සමාගම් හා බැංකු විසින් ගොඩගසාගෙන ඇති දැවැන්ත නය හා ''විස කැවුනු'' වත්කම් හැකිතාක් ප්‍රමානයක් රාජ්‍යය වෙත මාරුකර හැරීමයි.

පසුගිය තෙමසක කාලයක් තිස්සේ කොටස් වෙලඳපොලවල් පුම්බාලූවේ ද සකාරියාට සැනසුම් සුසුමක් හෙලීමට ඉස්පාසුව ගෙන දුන්නේ ද හරියට ම රාජ්‍යය විසින් දියත් කල මෙම ගලවා ගැනීමේ ක්‍රියාන්විතය යි. *වෝල් ස්ට්‍රීට් ජර්නල්* හි මෑතක පලවූ ලිපියකට අනුව ප්‍රකාශ වන්නේ, සියයට 30 කට වඩා යලි අත්කර ගැනීමේ (පූර්වයෙන් නැති භංගවූ වටිනාකමෙන්) මෙම ක්‍රියාවලියෙහි ප්‍රධාන හේතු කාරකය ''විශ්වාස කල හැකි ලෙසම සාමාන්‍යය දෙයකි''. නූතන යුගය තුල ලෝකය අත් නොදුටු තරමේ දැවැන්තවූ ඒකාබද්ධ මූල්‍ය උත්තේජක වැඩ සටහනක ප්‍රතිපල වශයෙන් ''මූල්‍ය වෙලඳපොලවල් ආන්ඩුවේ මුදල් වලින් සේදී ගියේය.''

එක්සත් ජනපද ආන්ඩුව දැනටමත්, ඇමරිකාවේ දදේනි ට මුලුමනින්ම වාගේ සමාන වන, ඩොලර් ට්‍රිලියන 12.7 ක් මූල්‍ය පද්ධතියට සහාය පිනිස ලබාදීමට පොරොන්දුවී තිබේ. මූල්‍ය අර්බුදය උග්‍ර අතට හැරුනු 2008 සැප්තැම්බරයේ පටන් ලොව පුරා ආන්ඩු, බැංකු ප්‍රතිප්‍රාග්ධනකරනය සඳහා ලෝක දදේනි න් සියයට 30 ක් තරම් වටිනාකමකට සමාන, ට්‍රිලියන 18 ක මහජන අරමුදල් සඳහා කැපවීම ප්‍රකාශ කොට තිබේ. මෙය තුඩුදී ඇත්තේ ඒවායේ මූල්‍ය තත්ත්වය පුපුරා යාමකට ය.

බ්‍රිතාන්‍යය ආන්ඩුවේ නය ඉක්මනින්ම දදේනි න් සියයට 100 ක් කරා ලඟාවනු ඇතැයි අපේක්ෂිත අතර, ජපාන ආන්ඩුවේ නය 2011 වන විට සියයට 200 කරා එලඹෙයි. එක්සත් ජනපද ආන්ඩුවේ නය එම කාලයම වන විට දදේනි න් සියයට 100 ක් වනු

ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජාමූඅ) ආර්ථික වේදීන්ට අනුව 2014 වන විට ජී-20 ආර්ථිකයන්හි දදේනි අනුපාතයට අනුව ආන්ඩුවල නය, 2007 තිබූ මට්ටම් සමග සසඳන කල ගෝලීය ආර්ථිකයෙන් සියයට 85 ක් පමන වන පරිදි සියයට 36 ක ප්‍රතිශතයකින් වැඩිවනු ඇත.

## නව දේශපාලන තන්ත්‍රයක්

කෙසේ වුව ද රාජ්‍ය මූල්‍යයට සීමාන්තික ලෙස වියදම් දැරිය නොහැක. බැංකු වලට මුදල් සැපයීම සඳහා රාජ්‍ය විසින් ලබාගන්නා නය ගෙවිය යුතු වන්නේ වැඩකරන ජනතාව බලහත්කාරයෙන් දුගී භාවයට ඇද හෙලන, ආන්ඩු වියදම් හා සමාජ සේවාවන් කපා දැමීම මගිනි. සමාජ කොන්දේසි හා ජීවන තත්ත්වයන් මත එල්ල කෙරෙන මෙම ප්‍රහාරයේ පරිමාව, එයට සම්බන්ධ මුදල් ප්‍රමානයේ තරමට කෙලින්ම සමාන වනු ඇත. බ්‍රිතාන්‍යයේ පලවූ එක් තක්සේරු වාර්තාවකට අනුව ආන්ඩුවේ ගිනුම් පොත් තුලනය කිරීම පටන්ගැනීමට පවා, එහි පරිභෝජනය 2006-07 කාලයේ තිබූ මට්ටමින් අඩුම තරමින් සියයට 20 න් වත් පහත හෙලිය යුතුය.

ඇමරිකාව තුල ආන්ඩුවේ නයෙහි ''තැතිගන්වන සුලු'' වර්ධනය සකාරියා විසින් පෙන්වා දෙයි. විශේෂයෙන්ම හිමිකම් හා විශ්‍රාම දීමනා පොරොන්දු ද ඇතුලත්වූ විට එහි තත්ත්වය ගැන ඔහු සඳහන් කරන්නේ ''පරතරය පියවීම ගැන කිසිවෙකුත් බැරෑරුම් උත්සාහයක් දරා නැත'' යනුවෙනි. ''එය කල හැක්කේ (1) බදු වැඩි කිරීමෙන් හෝ (2) වියදම් කැපීම මඟින් පමනකි.''

''මෙය නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ ව්‍යාධියයි. පද්ධතියට දිගු කාලීන වාසි තකා කෙටිකාලීන වේදනාව පැටවිය නොහැකි වී ඇත.'' දේශපාලන ඇඟවුම් පැහැදිලි ය. පවත්නා දේශපාලන පර්යාය ඇතුලත ආන්ඩුවේ නය අහෝසි කිරීම සඳහා අවශ්‍ය ආදායම් වැඩිකර ගැනීමට දැවැන්ත වියදම් කප්පාදුවක් පැටවිය නොහැකිය. එක්සත් ජනපදයේ හා අනෙකුත් ප්‍රධාන ධනේශ්වර ආර්ථිකයන්හි ප්‍රතිව්‍යුහකරනයක් සඳහා නව හා වඩාත් මර්දනකාරී තන්ත්‍රයන් අවශ්‍ය කෙරේ.

ධනවාදය අර්බුදයට හේතුව නොවේ යයි කියා සිටීමට ඔහු දරන උත්සාහයේදී සකාරියා, අසාමාන්‍ය දුරකට ගමන් කරයි. ඔහු අවධාරනය කරන්නේ සැබෑ ගැටලුව, අසාර්ථකත්වය නොව ඕනෑවට වැඩි සාර්ථකත්වය බවයි. ලෝකය ''දේශපාලන ස්ථාවරත්වයේ අත්‍යසාමාන්‍ය පරිමානයකට'' ගමන්කොට තිබේ. මහා බලවතුන් අතර ප්‍රධාන මිලිටරි තරගයක් ඇත්තේ නැත. දේශපාලන ප්‍රචන්ඩත්වය බැස යමින් තිබේ. ඉරාකය, පකිස්ථානය හා ඇෆ්ගනිස්ථානය තුල එක්සත් ජනපදය විසින් දියත් කොට තිබෙන යුද්ධයන් ගැන සලකන කල්හි එවන් ප්‍රකාශ විස්තර කල හැක්කේ අභූතයන් ලෙස පමනි. මහා බලවතුන්ගේ එදිරිවාදිකම් බැසයමින් අතැයි යන්නේදී යමෙකු විසින් පෙන්වා දිය යුත්තේ චීනයේ නැගීම පිලිබඳව එක්සත් ජනපද ප්‍රතිපත්ති සම්පාදක කවයන් තුල නිරන්තරව හා වර්ධනය වෙමින් තිබෙන කනස්සල්ලයි.

කෙසේ වෙතත්, සකාරියා, ඔහුට කීමට අවශ්‍ය කථාන්තරයට හරස් වන සාධක වලට ඉඩ දීමට සූදානම් නැත. දේශපාලන ස්ථාවරත්වය, උද්ධමනය පහත වැටීම, ආර්ථික වර්ධනය යන මේ දේවල්, ගෝලීය ආර්ථික පද්ධතියක ස්ථාපනය වීම සමඟ එක්ව ගමන් කරන බව ඔහු කියා සිටියි. ප්‍රාග්ධන පිරිවැය පහත වැටෙන විට එය ''හොඳ කාලයක්'' වන අතර මිනිසුන් සෑහීමකට පත් කරන්නේය යන්න ඊටත් වඩා තකතිරු ය. කිසිවෙකුත් කවර කාලයක වත් දැක ඇතිවාට වඩා සංකීර්න හා වේගවත් තරග ධාවනයේ යෙදෙන මෝටර් රියකට සමාන තත්ත්වයක් කරා ලෝක ආර්ථිකය පැමින තිබේ. මීට පෙර කිසිවෙකුත් ධාවනය කර නොමැති මෙවන් රථයක් පදවන්නේ කෙසේද යන්න කිසිවෙකුත් නොදන්නා තැනකට මෙම තර්කය හැරවී ඇත්නම් එහි අර්ථය වාහනය හැප්පී වැනසෙනු ඇති බවයි.

අනාගතය පිලිබඳව කෙසේ ද? ''සැබෑ ගැටලුව වනාහි අප තවමත් මේ රථය පදවමින් සිටීමයි. ගෝලීය ආර්ථිකය පවතින්නේ අතිශයින්ම සංකීර්න තත්ත්වයකය, අන්තර් සම්බන්ධිතව හා අසමතුලිතව ය. චීන්නු තවමත් ඔවුන්ගේ අතිරික්තයන් ගොඩගසමින් හා ඒවා යම් තැනක තැන්පත් කර ගැනීමේ අවශ්‍යතාවෙන් පෙලෙති. පද්ධතිය තවත් කඩා වැටීමකට කරලිය සකසන්නේ නැති තත්ත්වයක් සඳහා වොෂින්ටනය හා බීජිනය අනුක්‍රමයෙන් ඔවුන්ගේ අන්‍යොන්‍ය රඳපැවැත්ම ස්ථාවර කර ගැනීම පිනිස වෙහෙස නොබලා කටයුතු කල යුතුය.

වෙනත් වචන වලින් කිවහොත්, එය නිර්මානය කල සියලු ප්‍රතිවිරෝධයන් එලෙසම පවතිද්දී හා විසඳුමක් අහලකටවත් ලගාවී නොතිබියදී, අර්බුදය නිමාවකට පැමින තිබේ.

ලෙනින් විටෙක සඳහන් කලේ මාක්ස්වාදයේ ශක්තිය වනාහි එය සත්‍ය වීම බවයි. වෛෂයික සාධකයන්ගේ එම තර්කනය ම මඟින් මාක්ස්වාදයේ ඉතා සවිඥානක විරුද්ධවාදීන්ට පවා මාක්ස්වාදී විශ්ලේෂනයේ මාධ්‍යය සකස් කල ක්‍රියාවලීන් පෙන්නුම් කර දීමට බලකෙරී තිබේ. ප්‍රශ්නය මෙයයි.

සකාරියාට අනුව ''පුලුල් වශයෙන් ගත් කල අප මුහුනපා සිටින මූලික අර්බුදය ගෝලීයකරනය ම වේ. අප ජාතීන්ගේ ආර්ථිකයන් භූගෝලීය කරනය කර තිබේ. වෙලඳම, සංචාරය හා ගමනාගමනය මිනිසුන් එකට එක්කොට තිබේ. තාක්ෂනය ලෝක පරිමාන

සැපයුම් ජාලයන් ද සමාගම් හා ගනුදෙනු කරුවන් ද නිර්මානය කර තිබේ. එහෙත් අපගේ දේශපාලනය ස්ථිරව ම ජාතිකවාදී ලෙසින් පවතියි. මෙම වකවානුවේ හටගත් බොහෝ කඩා වැටීම්වල හදවතෙහි ම පැවතියේ මෙම ආතතියයි. එනම් ගෝලීය ගැටලු මිස ගෝලීය විසඳුම් ඇතිකල හැකි සුදුසු දේශපාලන ක්‍රියාවලියක් නිර්මානය නොකල, අන්තර් සම්බන්ධිත ආර්ථිකයන් අතර නොපෑහීමයි.''

මාක්ස්වාදී ව්‍යාපාරය දිගු කලක් තිස්සේ ලෝක ධනවාදයේ අති මූලික පරස්පර විරෝධයන්ගෙන් එකක් ලෙස, එක් අතෙකින් නිෂ්පාදන බලවේගයන්ගේ ගෝලීය වර්ධනයත්, අනෙක් අතට නීතිමය හා දේශපාලන උපරිව්‍යුහය පදනම්ව ඇති ජාතික රාජ්‍ය පද්ධතියත් අතර විසංවාදය හඳුනාගෙන තිබුනි. ඓතිහාසික අවශ්‍යතාවක් වන ජාත්‍යන්තරව සැලසුම් කල ආර්ථිකයක වර්ධනය මත පදනම් කල සමාජවාදය සඳහා තත්ත්වය සකස් කරන්නේ මෙම ප්‍රතිසතිතාවයි. ධනවාදය යටතේ නිෂ්පාදන බලවේගයන්හි වර්ධනය සාක්ෂාත් කිරීම සඳහා වැඩවසම් දේශපාලන පර්යාය පෙරලා දැමීමට සිදුවූ ආකාරයට ම අද දින, නිෂ්පාදනයේ භූගෝලීයකරනය විසින් ධනේශ්වර ජාතික රාජ්‍ය පද්ධතිය ද, සියවස් දෙක තුනකට පෙරාතුව පසුගාමී හා ප්‍රතිගාමීවූ වැඩවසම් ප්‍රාන්ත රාජ්‍යයන් හා ප්‍රතිරාජ්‍යයන්ගේ තැනට ම පත්කර තිබේ.

පසුගිය සියවසේ ප්‍රථම දශකය තුල පලමු ලෝක සංග්‍රාමය ලෙස පුපුරා ගියේ මෙම පරස්පර විරෝධයයි. එය දැන් වඩාත් ඉහල මට්ටමක දී යලි වතාවක් හිස ඔසවා තිබේ. එය විසඳිය හැක්කේ කම්කරු පන්තිය ගෝලීය පරිමානයකින් දේශපාලන බලය ගැනීම මගින් පමනි. එසේ නොමැති වුවහොත් මානව වර්ගයා, විසිවන සියවසේ මුල් දශක පහ අංගලක්ෂිතවූ ආකරයටත් වඩා ව්‍යසනකාරී වීමේ ශක්‍යතාව සහිත යුද්ධයන්ට හා ආර්ථික අර්බුදයන්ට කඩා වැටෙනු ඇත.

වඩාත් හොඳ ජාත්‍යන්තර සම්බන්ධීකරනයක් සඳහා සකාරියා කැඳවුම් කරයි. එහෙත් ධනවාදී පද්ධතියේ ම වෛෂයික තර්කනය සිදුවීම් තල්ලු කරන්නේ ප්‍රති විරුද්ධ දිශාවටයි. ධනේශ්වර නිෂ්පාදනය සිදුවන්නේ ජාත්‍යන්තර පරිමානයකිනි. එහි අරමුන මානව අවශ්‍යතා සපුරාලීම නොව පුද්ගලික ලාභ සමුච්ඡයයි. සමුච්ඡයේ ක්‍රියාවලිය ප්‍රසාරනය වන විට මාක්ස් සඳහන් කල පරිදි ප්‍රාග්ධනයේ වෙනස්වූ කොටස් සහෝදරාත්මක විලාසයකින් ක්‍රියාත්මක වෙමින් රාශිකරනය තමන් අතර බෙදා ගනියි. පද්ධතිය බිඳ වැටුනු විට මතුවන ප්‍රශ්නය තව දුරටත් ලාභය බෙදාගැනීම නොව පාඩු මගහැරීමට දරන උත්සාහයයි. ප්‍රචන්ඩ අරගලයක් දැන් මුදාහැරේ. එවන් බිඳවැටීමක් 19 වන සියවසේදී සිදුවූ ආකාරයට තවදුරටත් වෙලඳපොලේ හුදෙක් උත්සන්නවූ තරගකාරී අරගලයක් ලෙස නොපවතින අතර ධනේශ්වර කර්මාන්තයේ හා මූල්‍යයේ දැවැන්ත වර්ධනයත් සමඟ ආර්ථික අර්බුදය නොවැලැක්විය හැකි ලෙසම ධනේශ්වර රාජ්‍යයේ ඍජු මැදිහත්වීමක් ඉල්ලා සිටිනු ඇත.

පසුගිය වසරේ සිදුවූයේ මෙයයි. සැප්තැම්බරයේදී බැංකු හා මූල්‍ය පද්ධතිය දියකර හැරීමට තර්ජනය කරමින් ලේමන් බ්‍රදර්ස් බැංකුව බිඳවැටීමෙන් පසුව, ලෝකය වටා සියලු ආන්ඩු එයට ප්‍රතිචාර දැක්වූයේ ගෝලීයව සම්බන්ධීකරනය කල ක්‍රියාවලියක් සඳහා වැඩ කිරීම මගින් නොව, ක්ෂනික ගැටුම්වලට මග සලසන ''තමන්ගේම'' බැංකු පද්ධතිය රැකගැනීමට යොමුවෙමිනි. ගතවූ මාස ඇතුලත සිදුව ඇත්තේ මෙම විරසකය පුලුල් වීම පමනි. ජර්මානුවන් හා ප්‍රන්සයන් ඇමරිකානු ආන්ඩුවේ ඇපදීම් වලට විරුද්ධ වූයේ, ඒ මගින් එක්සත් ජනපද බැංකු වලට සිය ගෝලීය තත්ත්වයේ අධිකාරය යලි අත්කර ගැනීමට හැකිවනු ඇතැයි යන සාධාරන බිය හේතුකොට ගෙන ය. සිය පාර්ශවයෙන් ඇමරිකානු ආන්ඩුව, දැඩි පරිපාලනයක් වෙනුවෙන් කල කැඳවුම්වලට විරුද්ධ වූයේ ඒවා එක්සත් ජනපද මූල්‍ය ක්ෂේත්‍රය එල්ල කර ගෙන තිබූ බැවිනි. මේ අතර බ්‍රිතාන්‍ය ආන්ඩුව, *ෆිනෑන්ෂල් ටයිම්ස්* වාර්තාකරු ජෝන් ප්ලෙන්ඩර් විස්තර කල පරිදි, ''ගෝලීය මූල්‍ය පද්ධතියේ ත්‍රාසජනක ක්‍රීඩාපිටිය'' ලෙස සලකන ලද ලංඩනයේ තත්ත්වය අනතුරේ හෙලනු ඇතැයි යන බිය නිසා දැඩි පරිපාලනයක් හඳුන්වා දීමට අකමැති විය. මෙම තතත්වය, අර්බුදය ෆ්‍රෑන්ක්ෆර්ට් සඳහා වඩා හොඳ අවස්ථාවන් විවර කරනු ඇතැයි බලාපොරොත්තු රඳවාගෙන සිටි ජර්මානු ආන්ඩුවේ විරෝධයට ලක් විය. එසේම, විවිධ කාර්මික මැදිහත්වීම් ද ජාතික එදිරිවාදිකම් තියුනු කිරීමට තුඩුදී ඇත. නිදසුනක් ලෙස, ජර්මානු ආන්ඩුව ඕපල් මෝටර් රථ කර්මාන්තයට ඇප දීම බෙල්ජියමේ කටයුතු අනතුරේ හෙලීය. තනි යුරෝපීය වෙලඳපොලක කටයුතු හසුරුවන නීති පවා උල්ලංඝනය කර තිබේ ද යන ප්‍රශ්න පවා මෙහිදී මතුව තිබේ.

ජාත්‍යන්තර මූල්‍ය අසමතුලිතයන් විසඳගැනීම සඳහා එක්සත් ජනපදය හා චීනය අතර සම්බන්ධීකරනය පැවැත්වෙන අතර තුර, පසුගිය තෙමස තුල චීන මධ්‍යම බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය පද්ධතිය ප්‍රති ව්‍යුහගත කිරීම හා ලෝක සංචිත මුදල ලෙස ඩොලරයට ආදේශකයක් සෙවීම සඳහා දෙවරක් ම ඉල්ලීම් කර තිබේ. එය සිද්ධ වුවහොත් ලෝක මුදල ලෙස ඩොලරයේ භූමිකාව මතින් ඉමහත් වාසි බුක්ති විඳි ඇමරිකානු ධනවාදයේ තත්ත්වය, වේගයෙන් පිරිහී යනු ඇත.

ජාත්‍යන්තර සම්බන්ධීකරනයක අසාර්ථකත්වය හමුවේ සකාරියා අනතුරු අඟවන්නේ ''තව තවත් බිඳවැටීම් හා අවසානයේදී භූගෝලීයකරනයෙන් සුරක්ෂිතභාවය දෙසට, නැතහොත්, රක්ෂිත ජාතික ආර්ථිකයන් කරා, එනම් මන්දගාමී ආර්ථික වර්ධනය කරා, පසුබැසීමක් පවා'' සිදුවනු ඇති බවට ය. 1930 ගනන් වල හුදෙක් එවන් තත්ත්වයක වර්ධනය තුඩු දුන්නේ කෙලින්ම දෙවන ලෝක සංග්‍රාමය කරා තල්ලුවී යාමටය. අද එවන් තත්ත්වයක් ඊටත් වඩා ව්‍යසනකාරී ප්‍රතිවිපාක ජනනය කරනු ඇත.

අවසානයේදී සකාරියා නිගමනය කරන්නේ ''අපගේ ගැටලුවල හදවතෙහි ම ඇත්තේ සදාචාරය පිලිබඳ අර්බුදයක්'' විය යුතු බවටයි. පසුගිය දශකය තුල සිදුවූ බෙහෝදේ නීත්‍යානුකූල වුව ද ''වගකිව යුතු ලෙස කටයුතු කර ඇත්තේ මිනිසුන් සුලු සංඛ්‍යාවක් පමනි.'' කෙසේ වෙතත් මේ කිසිවක් ''ව්‍යාපාරිකයන් හදිසියේම සදාචාර විරෝධීන් බවට පත්වීම'' නිසා සිදුවූ දේ නොවේ. එය ව්‍යාපාරික ලෝකයේ විවෘතභාවය හා වැඩෙන තරගකාරිත්වයේ කොටසක් වෙයි.''

මෙම තර්කය තව දුරටත් ඉදිරියට ගෙන යාමට සකාරියා කැමැත්තක් නොදක්වයි. මක්නිසාද යත් එසේ කලහොත් ''සදාචාරාත්මක අර්බුදය'' ම වුවත් ධනේශ්වර ආර්ථික අර්බුදයේ ප්‍රකාශනයක් වන බව වඩාත් හොඳින් පැහැදිලි වීමට පටන් ගන්නා බැවිනි.

තව තවත් බොඳවී ගිය සදාචාරය හා සදාචාර විරෝධය ගැන නොකීවත්, මූල්‍ය ප්‍රාග්ධනයේ නැඟීම සමඟ බැඳුනු එම ක්‍රියාවලිය ම, නීත්‍යානුකූලත්වය හා නීති විරෝධීවීම අතර බෙදුම්කඩනය ඇඳ තිබේ.

තමන්ගේ පතුලේ සීමාව මහත්කර ගැනීමට, සැක කටයුතු අති නවීන ක්‍රමවේදයන් යොදා නොගන්නා කිසියම් ව්‍යාපාරික ආයතනයක්, අබලි බැඳුම්කරයන්ගෙන් මුදල් උපයන වත්කම් බැහැරකරන්නෙක් විසින් ගිල දැමීමට තර්ජනය කරද්දී ද, මූල්‍ය සුඳුවෙන් දැවැන්ත වාසි ඩැහැ ගැනීමට හැකියාව පවතිද්දී ද, මූල්‍ය ප්‍රභවයන් අති සංකීර්නවූ හා සැඟවුනු තරමට විකුනන්නාට ඉමහත් ලාභයක් ගලායද්දී ද, මූල්‍ය වත්කමක වටිනාකම, එක් හෝ තවත් විචල්‍යයක අගය, ඒවා පදනම්ව ඇති වීජගනිතමය ආකෘතීන් යොදාගනිමින් වෙනස් කිරීම මගින් සංශෝධනය කල හැකිව තිබියදී ද, සංකීර්න ප්‍රභවයන් යොදාගන්නා ඩොලර් දශ ලක්ෂ හා ප්‍රකෝටි සංඛ්‍යාත මූල්‍ය ගනුදෙනු සිදුවන ලෝකයක් තුල, කුමන මිල සදාචාර ද?

තව ද, සමස්ත දේශපාලන පද්ධතිය ම පාලනය කරන හා ඒ මත අධිකාරය දරන මූල්‍ය කතිපයාධිකාරයක වැඩී යාමෙහි අර්ථය වන්නේ, විසඳුමක හැකියාව තිබුනත්, වත්මන් පර්යායේ කිසිදු තර්කාන්විත ප්‍රතිසංස්කරනයක් ඇතිකල නොහැකි බවයි.

සකාරියාගේ සාදෘෂ්‍යයට අනුව සංකීර්න හා ප්‍රබල තරග මෝටර් රියක් වන ගෝලීය ආර්ථිකයේ නිෂ්පාදන බලවේග නිර්මානය කර ඇත්තේ, ලෝක කම්කරු පන්තියේ කායික හා බුද්ධිමය ශ්‍රමයේ සංකලනයක් මගින් වන අතර ඒවා ඉමහත් පරිමානයකට ද වර්ධනය කර තිබේ. එහෙත් ඒවා තව දුරටත් සුක්කානමේ රැඳී සිටිමේලා ඓතිහාසික, දේශපාලනික හා සදාචාරාත්මක අයිතිය අහිමි කර ගෙන සිටින පාලක පැලැන්තියක අතෙහි රැඳවිය හැකි නොවේ. සමාජවාදී විප්ලවයක් ද දේශපාලන බලය කම්කරු පන්තිය අතට මාරුකිරීම ද ඓතිහාසික අවශ්‍යතාවක් බවට පත්ව තිබෙන්නේ එබැවින් ය.

© www.wsws.org